# පුංචි ටින් සොල්දාදුවා



## (පශ්චාත්) යුධ අභ්‍යාසය

"බටයා"ගේ කතාව ඉදිකිරීමේ අභ්‍යාසය සඳහා ඔබේ ඔළු ගෙඩිය වැඩබිමක් කර ගැනීමට ඉතාම ඒක පාර්ශ්වික ලෙස මම තීරණය කළා.

**ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය-**

1. පොටි (ක්ලේ).
2. හාන්සි පුටුවක්.
3. බැන්ඩේජ් සහ ගෝස් ඇති පමණ.

බටයා හිටියෙ අපේ ඒ-ලෙවල් පන්තියේ. ඌ "හටයා" නොවී බටයා වුණේ කැඩෙට්ං සඳහා මුළුමනින්ම කැප කරන ලද උගේ ජීවිතය අපේ කොල්ලන්ට රසවත් බයිට් එකක්ම වූ නිසා. බටයා පන්තියට ආවේ ඉඳලා හිටලා. සුදු ෂර්ට් එක යට ඇඳුමටම යට කරලා- කොණ්ඩෙ බූ ගාලා- මූණ පේන තරමට පොලිෂ් කරපු සපත්තු දාලා- බයිසිකල් හැන්ඩ්ල් එකක් ගිලපු පිඹුරෙක් වගේ ඉස්කෝලෙ පුරා ඇවිදපු බටයා කැඩෙට්ං සහ හමුදාව ගැන හැර කතා කළේ එකම එක කෙනෙක් ගැන විතරයි.

## උමාව ඇඹීම

දැං අපි අර **ක්ලේ ගුලියෙන්** ලස්සනට ඒ කෙනාව අඹමු. එයා නිළියෙක්. ගායිකාවක්. ක්ලේ ගුලි කර කර හෙමින් හෙමින් ඇව අඹමු. මතක් කරලා ඉඟ ළඟ හුඟාක් සිහින්වට අඹන්න. අත් කකුල් වාත්තු කරන්න වීනස්ගෙ වගේ. ඇඟිලි තුඩු සිහින්. දෙතොල්-පළල්. උකුළ අඹද්දි- පපුව අඹද්දි ක්ලේ වලට ලෝබ වෙන්න එපා. අන්තිමටම ලා රතු කම්මුලුයි නැහැයයි උඩින් කතා කරන ඇස් දෙක තියන්න. කොණ්ඩෙ පිට දිගට වැටුනොත් තමයි හැඩ. හරි දැන් එයාව දෙමු බටයගෙ අතට. බටයා ප්‍රථමාධාර පාඩමේදි ඉගෙන ගත්තු විදිහට එයාගෙ නැහැ පුඩු දිගේ හුස්ම පිඹිනවා. මෙන්න ගැස්සිලා එයා නැගිටිනවා.

එයා උමා. උමයංගනී දේවපතිරාජ.

උමා ප්‍රසිද්ධ නිළියෙක්. ගායිකාවක්.

බටයා අපි කට්ටිය එකතු වෙලා අඹපු උමාව එයාගෙ අර ලොකු ආමි බෑග් එකේ දාගෙන යනවා. බටයා ගිනි අවුවෙ කැඩෙට්ං ප්‍රැක්ටිස් කරලා එන තුරු පිට්ටනිය ගාව රට දෙල් ගහ යට- බෑග් එක ඇතුළට වෙලා උමා ඉන්නවා. ඉඳලා හිටලා පන්තියට ආවත් බටයා හිටියෙ එක ඇහැක් බෑග් එක ඇතුළට දාගෙන. උමා බෑග් එක ඇතුළෙ ඉඳන් බටයාව යුද්දෙට තල්ලු කෙරුවා. හුරුබුහුටි ඒ.කේ. ෆෝටි සෙවන් එකක් බලාගෙන උන්නා බටයා එන තුරු.

අපි ඉස්කෝලෙන් අස්වුනා. බෑග් එකත් අරං බටයා කොතලාවල ඇකඩමි ගියා. යුද්දෙට ගියා. බෝම්බ සද්දෙට බයේ උමා බටයගෙ බෑග් එකෙන් පැනලා ගිහිං වවුනියාවෙන් කොළඹ ඉන්ටසිටියක නැග්ගා. බටයා තනියම සටන් කළා. උමායි අපියි කොළඹ ඉඳන් ටී.වී. එකෙන් බලාගෙන හිටියා. බටයා තට්ට තනියම සටන් කළා.

එක දවසක් එකෝමත් එක යාපනේක දොයියන් හිටපු ජොනී බට්ටෙක් බටයගෙ කකුලක් වැදිලා ඇහැරුණා. ජොනී බට්ටට හොඳටෝම කේන්ති ගිහිං එයා බටයගෙ කකුල හපා කෑවා. බටයගෙ කකුල තියෙන්න ඕන තැනට දොස්තරලා හිස් තැනක් බද්ධ කෙරුවා.

දැන් අපි බටයාගෙ හිස්තැන වෙනුවෙන් විනාඩියක නිශ්ශබ්දතාවයක් ආරක්ෂා කරමු. ටීක්. ටීක්. ටීක්.

නිශ්ශබ්දතාවය සහ හිස්තැන- ඒ දෙකම එක වගේ - හානේ. හරි ෂෝක්. ඕනෙනං අපිට පුළුවන් විශේෂ හේතු ඉදිරිපත් කරලා මේ හරි ෂෝක් විනාඩිය සදා-කාලයක් දක්වා දික් කරගන්න.

හරි ළමායි- හයියෙන් අල්ලගන්ඩ.

මං දැං කතාවෙ ට්‍රැක් පන්නනවා රාගමට. රාගම දුම්රිය මංසන්ධියකුයි, ගුවන් පාලමකුයි, ඉස්පිරිතාලෙකුයි, රණ-විරු සෙවණකුයි තියන කොළඹට ළඟ උප-නගරයක්.

## හීන කුමාරි නැවත එයි.

අපි රාගම ස්ටේෂන් එක ළඟ ඉඳන් හොරපෙ ස්ටේෂන් එක පැත්තට රේල් පාරට සමාන්තර පොඩි පාරෙ යනවා. කවුරුහරි අපිට කලිං දුවලා ගිහිං රණවිරු සෙවණේ මිදුලෙං අපේ **හාන්සි පුටුව** තියලා බටයව එක්කන් ඇවිත් ඒකෙන් වාඩි කරවන්න. අපි විනාඩි දහයක් ඇවිදලා බටයාගෙ අළුත් ලෝකයට මීටර් සීයක් මෙපිට වගුරු බිමේ නතර වෙලා ඉතුරු ටික බලාගෙන ඉමු. (හොරෙන්)

බටයාව පේනවා.

රණවිරු සෙවණ සරසලා.

මොකක් හරි උත්සවයක් වගෙයි.

හාන්සි පුටුවෙ අර කකුල් තියන ඇඳි දෙකෙන් එකක් දිග ඇරලා බටයා කකුල තියාගත්තා. හිස්තැන සරමෙන් වැහිලා තිබුණා. උගෙ මූණෙ හරි ජාති හිනාවක් අද.

ඇයි යකෝ කකුලකුත් නැතුව- මොකද බං මාර ආතල් එකේ?

"අද රෑ මියුසිකල් ෂෝ එකක් මේකෙ. උමාත් එනවලු."

උමයංගනී දේවපතිරාජ. පැනලා ගිය හීන කුමාරි.

බටයා සතුටෙන් මහත් වෙලා උන්නෙ. හාන්සි පුටුව මදි උඌට. උඌ මහත් වුනා- රාගම ටවුන් එකත් යට වුනා උගේ හිතට. රෑ වෙන්ඩ රෑ වෙන්ඩ ඒක ජාඇල ආසනේ තරම් ලොකු වුනා. හැන්දෑවෙ නළු නිළියොයි ගායක ගායිකාවොයි අරන් ඊබට් සිල්වා බස් එක එද්දි බටයා හිටියෙ ගම්පහ දිස්ත්‍රික්කෙ තරමට මහත් වෙලා. ජීවිතයක් බලං හිටපු ඒ මොහොත.

සංගීතේ ඇරඹුනා. එළි විදුලි එළි- කෙළි ගිනි කෙළි. කකුල් තියන අය ස්ටේජ් එක පල්ලෙහා නැටුවා. කකුල් නැති අය වීල් චෙයාර් වල ඉඳන් නැටුවා. බටයා බලං හිටියේ උමා ස්ටේජ් එකට නගින තුරු.

අන්න ඈ. ස්ටේජ් එකට නැග්ගා.

අන්න ඈ දෙවඟනක් වෙලා. ඈ නටන විදිහට බටයට බයත් හිතුනා - ක්ලේ අලෝපු තැන්වලින් පුපුරයිද කියලා. උමා සිංදු තුනක් කිවුවා. බටයා ලංකාව තරම් ලොකු වෙලා ස්ටේජ් එකයි උමාවයි ඇස් දෙකෙන් ගිල්ලා.

රණවිරුවන්ට ජයවේවා කියලා උමා අන්තිමට කෑ ගැහුවා. කණ් බිහිරිවෙන තරම් අත්පොළසන් හඬක් නැගුනා.

සංගීතේ ඉවර වෙලා උමාලා ඩිනර් ගත්තා රණ විරු සෙවණේ. බටයට කන්න බැහැ. එයා හිටියෙ මත් වෙලා. බටයලා කට්ටිය ඩයිනිං ටේබල් එක ළඟ රවුමට වාඩි වෙලා හිටියා. උමාලා ආවා රවුමේ හැම කෙනෙකුටම අතට අත දෙමින්. දැන් ඈ බටයා ළඟට එන්න ළඟයි. තව තුන් දෙනයි.

හරි දැං අපේ කට්ටිය ඇඟිලි තුඩු උඩ නගින්න. අපේ කතාවෙ උසම තැන. තව දෙන්නයි. තව එක්කෙනයි.

මෙන්න වැඩේ වෙනවා.

උමා බටයාගේ අත අල්ලා ගන්නවා සමගම ලෝකය නැවතුනා. උමායි බටයයි හැර අනික් හැම කෙනෙක්ම හැම දෙයක්ම රත්තරං පාට කුඩක් බවට හැරිලා හෙමින් හුළඟෙ ගියා. මොකුත් නෑ. ඒ දෙන්නා විතරයි.

ඔන්න ඔන්න උමා එයාගෙ සිහින් අතැඟිලි වලින් බටයගේ අත මිරිකලා අල්ලගත්තා.

**මෙන්න බටයාව පුංචි ටින් සොල්දාදුවෙක් වුනා.**

මෙන්න එයා උමාගෙ මුදු අත දිගේ හෙමින් උඩට බඩගානවා. බඩගාලා බඩගාලා ගිහින් එයා ෂිපරය ඇරගෙන උමාගෙ රත්තරං පාට අත් බැගයට රිංගුවා. උමා ෂිපරය වහගෙන දුවලා ගිහිං මිදුලෙ නවත්වලා තිබුණු පියාඹන මැජික් පලසට නැග්ගා.

## පොරොන්දු දේශයට උඩින්

පැය දෙක තුනක් අහස දිගේ එයාලා පාවුණා. යන ගමන් පුංචි ටින් සොල්දාදුවයි නිළියයි සිංදු කිවුවා කෙළවරක් නැතුව.

රන් මලක් ලෙස දෙව් බඹුන් දෝතින් පිදූ මේ පින් බිමේ
පස් පිඩක් ගිලිහී නොයන්නට රන් වැටක් ඇත සිවු කොණේ

කැළණි පාලමට උඩින්. අළුත් කඩේ උසාවියට උඩින්. ලේක් හවුසියට උඩින්. අරලියගහ මන්දිරේට උඩින්. පාර්ලිමේන්තුවට උඩින් මැජික් පලස පාවුනා. පුංචි ටින් සොල්දාදුවා උමාගෙ බෑග් එක අස්සෙ ගුලි වෙලා උන්නා. එයා හිටියෙ සනීපාරක්ෂක තුවායකටයි විලවුන් බෝතලේකටයි මැද්දෙං. රුපියල් දාහෙ කොළයක් උඩ. පාවෙලා පාවෙලා මැජික් පලස කෝට්ටේ උමාලගෙ මිදුලට පහත් වුණා.

උමා පුංචි ටින් සොල්දාදුවාව එයාගෙ කාමරයට එක්කරගෙන ගියා. ඇඳේ ඇල වෙලා ටින් සොල්දාදුවාව එළියට අරන් පපුව උඩින් තියා ගත්තා. උමා හැදුවෙ එයාගෙ බෙල්ලයි පපුවයි මැද ටින් සොල්දාදුවාව හිටවන්න. ඒත් සොල්දාදුවාට තිබුණෙ එක කකුලක් විතරක් හින්දා එයාව කඩා ගෙන වැටුනා උමාගෙ ලැම උඩට. උමාට නින්ද ගියා මහන්සියට. සොල්දාදුවා අමාරුවෙන් රූටගෙන රූටගෙන පපුවෙන් බැහැලා උමාගෙ කොට්ටෙ ඉතිරි වෙලා තිබුණු ඉඩේ නිදා ගත්තා.

එදා ඉඳන් පුංචි ටින් සොල්දාදුවා නිළියගේ තනියට උන්නා. පුංචි ටින් සොල්දාදුවා නැතුව උමා කොහෙවත් ගියෙ නෑ. උමා කන්න ගියත්- නාන්න ගියත්- ෂූටිං ගියත් කොහෙ ගියත් ටින් සොල්දාදුවාව අරගෙනයි ගියේ. සොල්දාදුවාට කකුල නැති අඩුවක් දැනුනෙම නෑ.

ඔන්න දවසක් සොල්දාදුවා ගැයුවා බැරිණ්ඩි ස්වරයෙන් මෙහෙම.

"වන් ටූ ත්‍රී ෆෝ පයිව් සික්ස් සෙවන්..."

එතකොට නිළිය ගැයුවා හුරතල් ස්වරයෙන් මෙහෙම-

"ඕල් ගුඩ් සෝල්ජර්ස් ගෝ ටු හෙවන්..."

ඔන්න දැං දෙන්නම කියමු.

"වන් ටූ ත්‍රී ෆෝ පයිව් සික්ස් සෙවන්... ඕල් ගුඩ් සෝල්ජර්ස් ගෝ ටු හෙවන්..."

උමා එයාට නිදා ගන්න කියලා එයාගෙ තරමට ගැලපෙන පුංචි කොට්ටෙකුත් මහලා දුන්නා. උමා හැමදාම නිදියන්න කලින් ටින් සොල්දාදුවාට හාද්දක් දුන්නා. සොල්දාදුවාත් උමාගෙ මූණ දිගේ බඩ ගගා පුංචි පුංචි හාදු ගොඩාක් දුන්නා.

ඒත් එක දවසක් උමාව හදිසි වැඩකට එක්කගෙන ගියා කවුදෝ ඇවිත්. එදා හදිසිය වැඩි කමට එයා ගියේ පුංචි ටින් සොල්දාදුවාව අමතක වෙලා. සොල්දාදුවා ඇඬුවා. උමාගෙ ඇඳ උඩට වෙලා ටින් සොල්දාදුවා එයාගෙ පුංචි කොට්ටෙ බදා ගෙන ඇඬුවා.

එදා උමා ආවෙ හුඟාක් රෑ වෙලා.

උමා ඇඳ උඩ නිදා ගෙන බෑග් එක ඇරලා තඹ පාට කෙස් තියන පුංචි සිංදුකාරයෙක් එළියට ගත්තා. එයා උමාගෙ පපුවයි බෙල්ලයි මැද්දෙ හිටගෙන රිදී පාට ගිටාරයක් ගගහා අළුත්ම තාලෙ සිංදුවක් කිවුවා. උමාට පුංචි ටින් සොල්දාදුවාව සම්පූර්ණයෙන්ම අමතක වුනා. එදා රෑ උමා සොල්දාදුවාව අරං ගිහිං සාලෙ තිබ්බ කැබිනට් එකෙන් දැම්මා. සොල්දාදුවාගෙ පුංචි කොට්ටෙ උඩ සිංදුකාරයව නිදි කෙරෙවුවා.

සොල්දාදුවා ඇඬුවා. කැබිනට් එකේ හිරවෙලා ඇඬුවා. සති දෙකකින් අර තඹ පාට කොණ්ඩෙ තිබුණු පුංචි කෝකිලයත් කැබිනට් එකට ආවා අඬ අඬ. තවත් සතියකින් බඩ මහත ඔලුව පොඩි ඇමති කෙනෙක් ආවා කැබිනට් එකට. අඬ අඬ.

ඊගාවට කට්ට කළු මුදලාලි කෙනෙක්. අඬ අඬ.

තම්බපු ඉස්සෙක් වගේ සාමාන්‍යාධිකාරී කෙනෙක්. අඬ අඬ.

රතු රැවුලක් තියන කැරලිකාරයෙක්. අඬ අඬ.

ජාතික ඇඳුමක් ඇඳපු වීරයෙක්. අඬ අඬ.

තව ගොඩාක් අය පිරුනා කැබිනට් එකේ. අඬ අඬ. පුංචි ටින් සොල්දාදුවට හුස්ම ගන්නවත් ඉඩක් තිබුණෙ නෑ. දවසක් උමාලගෙ තාත්තා සොල්දාදුවව එළියට අරන් එයාගෙ බෙල්ලෙන් අල්ලන් තනි කකුලෙන් පිට කැසුවා. පිට කසලා සොල්දාදුවව ජනේල් පඩිය උඩින් තිබ්බා.

අහිංසක සොල්දාදුවා තනි කකුලෙන් බැලන්ස් නැතුව ජනේලෙං එළියට වැටුනා පිළිකන්නට. අනේ වැටුණු පාරට එයාගෙ ඉතුරු වෙලා තිබ්බ කකුලත් කැඩුණා. සොල්දාදුවා අඬ අඬ වැස්සෙ තෙමී තෙමී උන්නා.

එයාට නැගිටින්න බෑ. කකුල් දෙකම කැඩිලා.

## සොල්දාදු වැස්ස

ලොකු හුළඟක් හැමුවා. පුංචි ටින් සොල්දාදුවාව ගහ ගෙන ගියා අහසට. අහසෙ තිබ්බ වැහි වලාකුළක එයාව හිර වුණා. වැහි වලාකුළ හැමුවා-පාර්ලිමේන්තුවට උඩින්. අරලියගහ මන්දිරේට උඩින්. ලේක් හවුසියට උඩින්. අළුත් කඩේ උසාවියට උඩින්. කැළණි පාලමට උඩින්.

මුතුරාජවෙල අහස දිගේ වැහි වළාකුල පාවුනා. පාවෙලා පාවෙලා ඇවිත් වැස්සා රාගම පොළොවට. වැහි වළාකුළු වල හිර වෙලා ඉඳලා අසරණ පුංචි ටින් සොල්දාදුවෝ දහස් ගාණක් වැස්සා රණ-විරු සෙවණට. අනේ අපේ සොල්දාදුවාවත් වැටුණා අර අපි තියපු හාන්සි පුටුව උඩට.

හොරපෙ ස්ටේෂමේ ඉඳගෙන කෝච්චියක් හූ කියලා අඬ ගැහුවා එයාගෙ යාළු කෝච්චියට. යාළු කෝච්චිය රාගම ඉඳං යටි ගිරියෙන් හූ තිය තිය දිව්වා රණ-විරු සෙවණ ඉස්සරහිං.

අපේ ලොකු හාන්සි පුටුව උඩ පුංචි ටින් සොල්දාදුවෙක්. අපි වගුරු බිමේ ඉඳන් හොරෙන් බලාගෙන ඉමු.

සොල්දාදුවා හුඟාක් දුකෙන් කල්පනා කෙරුවා මම පොඩි වෙලාද? එහෙම නැත්නම් හාන්සි පුටුව ලොකු වෙලාද? එයාට හිතා ගන්න බැරි වුණා.

## ශේෂය ප/ගෙ.

දැං ඔයාලට පුළුවන් **බැන්ඩේජ් සහ ගෝස්** ඇති පමණ පාවිච්චි කරලා ඔයාලගෙ තුවාල වෙච්චි ඔළු වෙලා ගන්න.

අර උඩ පැන පැන උමාව අඹපු ක්ලේ වලින් ඉතුරු වෙච්චි ඒවා එහෙම නැද්ද?

(අර මනුස්සයට කකුල් දෙකක් අඹපල්ලා.)

**තරංග ජයසේන**

koombiyaonline@yahoo.com

www.koombiya.nidahasa.com